# 多言語情報コーナー　　　　　　　　　　　　（令和７年　９月号）

## 1. ජනගහන සංගණනය පිළිබඳව

2025 ඔක්තෝබර් 1 වන දින වන විට ජපානයේ ජීවත් වන සියලුම පුද්ගලයින් සංඛ්‍යාව සහ පවුල් ව්‍යුහය විමර්ශනය කිරීම සඳහා ජනගහන සංගණනය පවත්වනු ලැබේ. එය සෑම වසර පහකට වරක් පවත්වනු ලබන අතර එය ජපානයේ වැදගත්ම සංගණනයයි. එය වයස, ස්ත්‍රී පුරුෂ භාවය, පවුල් ව්‍යුහය, පදිංචි වර්ගය සහ රැකියාව පිළිබඳ දත්ත සමීක්ෂණය කර සම්පාදනය කරනු ලැබේ.

ජාතික ජනගහන සංගණනය ජාතිකත්වය නොසලකා ජපානයේ ජීවත් වන සෑම කෙනෙකුම සහභාගී කරගනු ලැබේ. එබැවින් විදේශිකයන් ද සමීක්ෂණයට ඇතුලත් වනු ලැබේ. සමීක්ෂණය පවත්වනු ලබන්නේ ඔබ මාස තුනක් හෝ ඊට වැඩි කාලයක් ජීවත් වූ ස්ථානවල හෝ ඔබ මාස තුනක් හෝ ඊට වැඩි කාලයක් ජීවත් වීමට සැලසුම් කරන ස්ථානවල ය.

සමීක්ෂණ පෝරමයේ ඔබ පුරවන ලද තොරතුරු සංගණනය සඳහා පමණක් භාවිතා කරනු ලැබේ.මෙම තොරතුරු සම්පාදනය කරන පුද්ගලයින් හඳුනා නොගන්නා ආකාරයකින් මෙය පවත්වනු ලබන අතර පොලිසියට හෝ ආගමන විගමන කාර්යාංශයට වෙත මෙම තොරතුරු ලබාදීමක් සිදුකරනු නොලැබේ.

මෙම ජන සංගණනය ජන හා සංඛ්‍යාලේඛන පනතට අනුකූලව පවත්වනු ලැබේ, එබැවින් මෙම සමීක්ෂණයට සහභාගිවීම අනිවාර්ය වේ. සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වීම ප්‍රතික්ෂේප කිරීම හෝ අසත්‍ය තොරතුරු සැපයීම දඩයකට හේතු විය හැක.

සැප්තැම්බර් මස අග සිට මෙම සමීක්ෂණයට සම්බන්ද නිලධාරීන් සෑම නිවසකටම ගොස් සමීක්ෂණ පෝරම බෙදා හරිනු ඇත.
සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වීම සඳහා, ඔබට පරිගණකයක් හෝ ස්මාර්ට් ජංගම දුරකථනයක් භාවිතයෙන් සමීක්ෂණයට මාර්ගගතව පිළිතුරු දිය හැකිය. ඔබ මාර්ගගතව පිළිතුරු නොදෙන්නේ නම්, ඔබ වෙත බෙදාහරිනු ලබන සමීක්ෂණ පෝරමය පුරවා ලබා දෙනලද ලියුම් කවරයේ දමා එවිය හැකිය.කලින් වෙලාවක් වෙන්කරවා ගැනීමෙන් ඔබට පිළිතුරු ලබාදීමේ හැකියාවක් නොමැතිනම් ඒ සඳහා සහය ලබාදීමේ හැකියාව ඇත.

ඔබ අන්තර්ජාලය හරහා ප්‍රතිචාර දක්වන්නේ නම්, ඔබට භාෂා හතකින් ප්‍රතිචාර දැක්විය හැකිය: ඉංග්‍රීසි, සරල චීන, සාම්ප්‍රදායික චීන, කොරියානු, වියට්නාම, ස්පාඤ්ඤ සහ පෘතුගීසි භාෂා මගින් සම්බන්ද විය හැක. ඔබ අදාල පෝරමය භාවිතයෙන් ප්‍රතිචාර දක්වන්නේ නම්, ඔබට ප්‍රශ්නාවලිය පරිවර්තන එකතුව භාවිතා කළ හැකි අතර, එය භාෂා 28 කින් ලබා ගත හැකිය.

මාර්ගගත ප්‍රතිචාර කාලය සැප්තැම්බර් 20 සිට ඔක්තෝබර් 8 දක්වා වේ. පත්‍රිකා සමීක්ෂණ

ප්‍රතිචාර කාලය ඔක්තෝබර් 1 සිට ඔක්තෝබර් 8 දක්වා වේ.
ඔබගේ සහයෝගයට ස්තූතියි.

## 2. ඉලෙක්ට්‍රොනික සහතික කාඩ්පතෙහි කල් ඉකුත් වීමේ දිනය පිලිබඳව

ඔබට "මයින " සෞඛ්‍ය රක්ෂණ කාඩ්පතක් තිබේද? මෙය සෞඛ්‍ය රක්ෂණ කාඩ්පතක් ලෙස භාවිතා කිරීම සඳහා ලියාපදිංචි කර ඇති මයි නම්බර් කාඩ්පත වේ. ඔබට වෛද්‍ය ආයතන සහ ෆාමසිවලදී ඔබේ මයි නම්බර් කාඩ්පත ඔබේ සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ලෙස භාවිතා කළ හැකිය. මෙහිදී ඔබගේ මුහුණ හඳුනාගැනීම මගින් අදාළ සේවය ලබාගත හැක.

ඔබ මයි නම්බර් සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත භාවිතා කරන විට, ඔබ ඉලෙක්ට්‍රොනික පරිශීලක සහතිකය ලෙස ඉලක්කම් හතරක අංකයක් ඇතුළත් කරනු ලැබේ. මෙම විද්‍යුත් සහතික අංකය මගින් ඉදිරිපත්වන පුද්ගලයා ඔබ බව සනාථ කරනු ලැබේ.

මෙම විද්‍යුත් සහතිකයට වලංගු කාල සීමාවක් ඇත. වයස කුමක් වුවත්, එය නිකුත් කළ දින සිට ඔබේ පස්වන උපන්දිනය දක්වා වලංගු වේ. කල් ඉකුත්වන දිනය වන විට ඔබ විසින් නැවත එය අලුත් කළ යුතුය.
කල් ඉකුත්වන දිනට මාස දෙක තුනකට පෙර " කල් ඉකුත් වීමේ දැන්වීමක්" ඔබට තැපැල් ලැබෙනු ඇත. එබැවින් අවශ්‍ය කටයුතු සම්පූර්ණ කිරීම සඳහා කරුණාකර ඔබ මයි නම්බර් කාඩ්පත සහ අදාළ ඉකුත් වීමේ දැන්වීම් පත්‍රිකාව සමග තොචිගි නගර ශාලාවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ කවුන්ටරයට හෝ ඕනෑම සාමාන්‍ය ශාඛා කාර්යාලයකට පැමින අදාල කටයුතු සිදුකල හැක.

කල් ඉකුත් වූ දින සිට මාස තුනක් යන තුරු ඔබට ඔබේ මයි නම්බර් සෞඛ්‍ය රක්‍ෂණ කාඩ්පත භාවිතයෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත හැකි නමුත් කල් ඉකුත් වූ දින සිට මාස තුනක් ගත වූ පසු, ඔබේ මයි නම්බර් සෞඛ්‍ය රක්‍ෂණ කාඩ්පත තවදුරටත් වලංගු නොවේ.

**3.** තොචිගි නගරය සාමාජිකයන් වැඩි පවුල් සඳහා විශේෂ ජීවන ආධාර ප්‍රදානය පිලිබඳව

නගරයේ -විශේෂිත වැඩසටහනක් ලෙස, ආහාර මිල ඉහළ යාමෙන් හා අනෙකුත් භාණ්ඩවල මිල ඉහලයාමත් සමග විශේෂයෙන් පීඩාවට පත් වන, විශ්ව විද්‍යාල වයසට අඩු දරුවන් තිදෙනෙකු හෝ වැඩි ගණනක් සිටින පවුල් සඳහා විශේෂ ප්‍රදානයක් ලබා දීමට සැලසුම් කර ඇත.

තුන්වන දරුවාගේ සිට ප්‍රතිලාභ ලෙස එක් දරුවෙකුට යෙන් 10,000 ක් ගෙවීමට තීරණය කර ඇත. මෙය එක් වරක් පමණක් ගෙවීමක් වේ .

මෙම ප්‍රතිලාභය සඳහා සුදුසුකම් ලබන දරුවන් වන්නේ 2002 අප්‍රේල් 2 සහ 2026 පෙබරවාරි 28 අතර උපත ලැබූ ය වේ.

මෙහිදී තොචිගි නගරයේ ලිපිනයක් ඇති පුද්ගලයින්ට පමණක් ප්‍රතිලාභය සඳහා ඉල්ලුම් කළ හැකිය.
2025 මාර්තු 31 වන දිනට තොචිගි නගරයේ ළමුන් සඳහා ලබාදෙන දීමනා තොරතුරු වල ලියාපදිංචි සුදුසුකම් ලත් දරුවන් තිදෙනෙකු හෝ වැඩි ගණනක් සිටී නම්, ඔබ අයදුම් කිරීමට අවශ්‍ය නොවේ.ඉහත සඳහන් දීමනාව සැප්තැම්බර් අවසානයේ ඔබේ ලියාපදිංචි කල ළමා දීමනා ගිණුමට බැර කරනු ලැබේ.
මෙම ප්‍රතිලාභය සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ට අගෝස්තු 13 වන දින දැනුම්දීමක් සිදුකරනු ලැබේ.

අනෙකුත් සියලුම පුද්ගලයින් අයදුම් කළ යුතුය අතර කරුණාකර තොචිගි නගර ශාලාවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ ළමාරක්ෂක සාමාන්‍ය කටයුතු අංශයෙන් විමසීම් සිදුකල හැකිය.